# තත් නැති විණාව නැගූ හඬ

මාර්ටින් වික්‍රමසිංහ මහතා ගැන අප කලින් ද ඇතැම් දේ සඳහන් කර ඇත. ඒ මහතා පැරණි සිංහල සංස්කෘතිය භාරතයෙන් ස්වාධීන වූවක් බව පෙන්වීමට කටයුතු කළ නමුත් ඒ හුදෙක් බටහිරට සාපේක්ෂව කරන ලද්දක් විය. ඒ මහතාට වුවමනා කෙළේ බටහිර සංස්කෘතියේ ඇතැම් ලක්ෂණ පැරණි සිංහල සංස්කෘතියෙහි ද තිබූ බව පෙන්වීම ය. ඊනියා යථාර්ථවාදී රීතිය සිංහල සාහිත්‍යයෙහි තිබිණි යැයි පෙන්වීම, ජාතක කතා කෙටිකතා සමග සැසඳීම ආදිය මගින් ඒ මහතා බටහිර ගැති පරපුරක් බිහිකිරීමේ පුරෝගාමියෙක් විය.

බටහිර විද්‍යාව බුදුදහම සමග සංසන්දනය කරන, කාලාම සූත්‍රය වත්මන් බටහිර විචාරශීලී බව සමග සසඳන, ඊනියා ප්‍රබුද්ධ පිරිසක් බිහිකිරීමට ඒ මහතා දායක විය. එපමණක් නො වෙයි. ඒ මහතා අතින් සිදු වූ තවත් අවැඩක් වූයේ ඉංගිරිසි පොතපත හරිහැටි තේරුම් නොගෙන ඒ කරුණු සිංහලෙන් කීම ය. ඒ මහතා බටහිර විද්‍යාව සම්බන්ධයෙන් කියා ඇති දෙයින් පැහැදිලිවනුයේ ඒ මහතාට ඒ කරුණු හරිහැටි තේරුම්ගත නොහැකි වූ බව ය. අයින්ස්ටයිනීය සාපේක්ෂතාවාදයෙහි කියැවෙන සිද්ධි (events) ඒ සඳහා කදිම උදාහරණයකි. එහි දී ඒ මහතා යොදාගත් වචනය වූයේ භවන මාත්‍රා යන්න ය. ලෝකය ඊනියා භවන මාත්‍රාවලින් සැදිණි යැයි ඒ මහතා වැරදියට තේරුම් ගත්තේ ය.

ඉංගිරිසි පොත් හරිහැටි තේරුම් නොගෙන එහි සඳහන් ව ඇතැයි සිතන දේ සිංහලෙන් ලියන අද ද ජීවත්වන පිරිසකගේ පුරෝගාමියා මාර්ටින් වික්‍රමසිංහ මහතා යැයි සිතමි. ඒ පිරිසෙහි ලැයිස්තුවෙහි ඇතැම් පැරණි පඬිවරු ද වෙති. අයිස්ටයිනීය සාපේක්ෂතාවාදය නාගර්ජුනපාදයන් වහන්සේගේ සාපේක්ෂතාව සමග සංසන්දනය කෙළේ එවැනි එක් පැවිදි පඬිවරයෙකි. අවාසනාවකට මේ ප්‍රවනතාව තවමත් දකින්නට ඇත. විශේෂයෙන් ම බටහිරින් ලැබෙන දේ අපේ පැරණි සංස්කෘතියෙහි තිබිණි යැයි පෙන්වීම මේ ප්‍රවනතාවෙහි ප්‍රධාන ලක්ෂණයක් වෙයි. බුදු දහම බටහිර විද්‍යාව සමග සංසන්දනයකිරීම හා ජාතක කතාව කෙටිකතාව සමග සංසන්දනයකිරීම මෙහි විශේෂ අවස්ථා දෙකකි.

සිංහල සාහිත්‍ය විචාරයක් මාර්ටින් වික්‍රමසිංහ මහතා විසින් හඳුන්වාදෙනු ලැබිණි යැයි කීව ද එවැනි විචාරයක් දක්නට නැත. කව්සිළුමිණ පැරණි භාරතීය මහාකාව්‍ය දෙස බලා කරන ලද නිර්මාණයක් යැයි කීමෙන් හා ගුත්තිලය යථාර්ථවාදී යැයි කීමෙන් සාහිත්‍ය විචාරයක් බිහි නො වෙයි. සිංහල සාහිත්‍ය විචාරයක් හඳුන්වා දෙන්නා පළමුව සිංහල සාහිත්‍යය පිළිබඳ අවධානය යොමු කළ යුතු ය. සිංහල සාහිත්‍යයට අරමුණක් තිබිය යුතු ද? එසේ නම් ඒ කුමක් විය යුතු ද? සාහිත්‍ය විචාරයෙන් අප බලාපොරොත්තුවිය යුත්තේ කුමක් ද?

සාහිත්‍ය විචාරය බටහිරයන් කියන ආකාරයට නම් විචාරකයන්ගේ කාර්යයකි. එයින් කියැවෙන්නේ විචාරය සාමාන්‍ය පාඨකයාගේ කාර්යයක් නොවන බව ය. මෙය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි බෙදීමට නම් එකඟ ය. එහි දී විචාරකයා සාමාන්‍ය පාඨකයාගෙන් වෙන් කෙරී විචාරය විශේෂඥයන්ගේ කාර්යයක් බවට පත්වෙයි. බටහිරයන්ට අනුව විචාරකයාගේ කාර්යභාරය වනුයේ කෘතිය සාමාන්‍ය පාඨකයාට හඳුන්වා දීම ය. කෘතියෙන් රසවිඳින ආකාරය, කෘතියෙහි චරිත ඒ ඒ අයුරින් හැසිරෙන්නේ ඇයි ද යන්න තේරුම්කිරීම, රසවත් කොටස් එසේ රසවත් වන්නේ ඇයිදැයි උලුප්පා දැක්වීම ආදිය විචාරකයාගේ කාර්යය වෙයි.

අප මේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව අදහස් එලෙස පවත්වාගෙන යා යුතු නො වෙයි. සාමාන්‍ය පාඨකයාට ද විචාරයකිරීමට හැකිවිය යුතු ය. මෙයින් අදහස්කරන්නේ සෑම අයකුට ම විචාරය පිළිබඳ එක සමාන හැකියාවන් තිබිය යුතු බව නො වෙයි. ඇතැමකුට විචාර කාර්යය වෙනත් අයට වඩා පහසුවෙන් කිරීමට හැකියාව තිබෙනු ඇත. එහෙත් සෑම අයකුම යම් මට්ටමක හෝ විචාරකයකු ලෙස සැලකිය යුතු ය. මෙය සිංහල බෞද්ධ සංස්කෘතියෙහි සාහිත්‍ය විචාරයෙහි දී පමණක් නොව වෙදකමේ දී වුව ද තිබිය යුතු ගුණයකි. වෙදකම ඉගෙනගත් වෙදමහත්වරු මෙරට සිටිය ද, සෑම අයකුට ම ප්‍රතිකර්ම පිළිබඳ සුළු අවබෝධයක් හෝ විය. අද සුළු අසනීපවලදී පවා විශේෂඥ වෛද්‍යවරුන් හමුවීමට ජනතාව පෙළඹී ඇත්තේ දැනුම බෙදා වෙන්කිරීමේ බටහිර ක්‍රිස්තියානි නූතනත්ව අදහස්වලට සමාජයෙහි ආධිපත්‍යයක් ඇති බැවිනි.

© Prof. Nalin De Silva

අප යට කී අයුරින් අදහස්කරන යුගයට කිසිදිනෙක ආපසු යා නොහැකි යැයි ඇතැමකු කියනු ඇත. අප කතාකරන්නේ ආපසු යෑමක් ගැන නො වෙයි. අප කතාකරන්නේ මේ සමාජයෙන් වෙනස් වූ නව සමාජයක් ගැන ය. ඒ සමාජය සිංහල බෞද්ධ සංස්කෘතිය මත පදනම්විය යුතු යැයි අපි කියමු. සිංහල බෞද්ධයන්ට මේ කියන දෙය තේරෙන්නේ නම් ඒ කළනොහැක්කක් නො වෙයි. අවශ්‍යවන්නේ ඒ පිළිබඳ අවබෝධය හා අවශ්‍යතාව පමණකි. මෙරට සිංහල බෞද්ධ සංස්කෘතිය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට යට නොවූ අවස්ථාවක්, එයටත් වඩා බටහිර ක්‍රිස්තියානි නූතනත්ව සංස්කෘතිය බෞද්ධ සංස්කෘතියට යට වූ අවස්ථාවක් ලෙස මෙවර මැයි දිනය සැමරීම හැඳින්විය හැකි ය. මැයි දිනය ද යෙදී තිබුණේ වෙසක් දිනයෙහි ය. මැයි දිනය පමණක් නොව මාක්ස්වාදය ද, කම්කරු පංති සංස්කෘතිය ද අයත්වන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට ය. මැයි දිනය ලෝක කම්කරුවන්ගේ දිනය ලෙස සැලකෙයි. ලංකාවේ බෙහෙතකටවත් කම්කරු පංතියක් සොයාගත නොහැකි නමුත් මැයි දිනය නිවාඩු දිනයක් බවට පත්කර ඇතිවා පමණක් නොව එදිනට ඊනියා කම්කරු පංතිය ව්‍යාජ කම්කරු පංති නායකයන් පෙරදැරි කරගෙන පෙළපාලි යනු දැකිය හැකි ය. එහෙත් මෙවර මේ ව්‍යාජ කම්කරු පංතියට ඊනියා මැයි දිනයට පෙර දිනයෙහි දී නිවාඩු නැතිව ම පෙළපාලි යෑමට සිදුවිය. ව්‍යාජ කම්කරු නායකයන්ට සිංහල බෞද්ධ සංස්කෘතියට හිස නමා වෙසක් දිනයෙන් වෙනස් දිනයක ඊනියා මැයි දිනය සැමරීමට සිදුවිය.

මෙය ඉතා සුළු දෙයක් ලෙස පෙනීගිය හැකි නමුත් එහි වැදගත් කරුණක් ගැබ් වී ඇත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අද සමාජයේ සමස්තයක් ලෙස ගත්කල ආධිපත්‍යය දරණ නමුත් ඇතැම් විශේෂිත වූ අවස්ථාවල සිංහල බෞද්ධ සංස්කෘතියට යම් කටයුත්තක් කිරීමේ හැකියාව ඇති බව ඉන් කියැවෙයි. සිංහල බෞද්ධයන් සවිඥානික ව ක්‍රියාත්මකවන වෙසක් උත්සවය වැනි අවස්ථාවක අන් අයට සිංහල බෞද්ධ ංස්කෘතියට මුල් තැන දී කටයුතුකිරීමට සිදුවෙයි. අද අවාසනාවකට බොහෝ කරුණු සම්බන්ධයෙන් සිංහල බෞද්ධයනට පොදු යැයි කිවහැකි ප්‍රතිපත්තියක් නැත. ඒ ඒ අවස්ථාවට ගැලපෙන පරිදි ඒ ඒ පුද්ගලයෝ විවිධ මතිමතාන්තර ගෙනහැර දක්වති. සමස්තයක් ලෙස ගත්කල එහි වරදක් නැති වුවත් පොදු තීරණ නොමැති ව සිංහල බෞද්ධ සංස්කෘතියට එයට හිමි තැන ලබාගත නොහැකි වනු ඇත.

බටහිරටයන් සාධාරණ වශයෙන් සාහිත්‍යය ගැන කුමක් කීවත්, සිංහල සාහිත්‍යය මූලික වශයෙන් ගත්කල ජනතාව යහමග යවන්නක් විය යුතු ය. කලින් ද කියා ඇති පරිදි යහමග යන්න ද සාපේක්ෂ වූවකි. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි යහමග යන්න බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි යහමගට වඩා වෙනස් වෙයි. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි යහමග යන්න නිවන වටා ගෙතී ඇත. සිංහල බෞද්ධයන් ද ඇතුළු සියළු බෞද්ධයන්ගේ මූලික අවශ්‍යතාව නිවන් අවබෝධ කිරීම ය. නිවන් අවබෝධ කරගන්නා තෙක් නිවි හැනහිල්ලේ ජීවත්වීම ය. සිංහල බෞද්ධයනට සමාජයට හෝ රාජ්‍යයට හෝ එරෙහිව පෞද්ගලිකත්වය වර්ධනය කළ යුතු නො වෙයි. සමාජය හා පුද්ගලයා අතර සමතුලිතවාක් තිබිය යුතු ය. එමෙන් ම මිනිසා සඳහා ස්වාභාවික සම්පත් හා පරිසරය මැවී ඇතැයි යන්න සිංහල බෞද්ධ සංස්කෘතියට ආගන්තුක ය. පරිසරය සම්බන්ධයෙන් තිබිය යුත්තේ ගතික සමතුලිතතාවකි.

එමෙන් ම සිංහල සාහිත්‍යයෙහි පොදු මිනිස් මනසක් ගැන අවධාරණයක් නොකළ යුතු ය. මිනිසුන් අතර යම් යම් සමානකම් තිබිය හැකි නමුත්, විශේෂයෙන් ම එකම සංස්කෘතියක ජීවත්වන්නවුන් සමස්තයක් ලෙස ගත්කල එක සංස්කෘතියක ජීවත්වන්නවුන් ලෙස හැසිරෙන නමුත් පුද්ගලයන් අතර ඇති වෙනස්කම් බො හෝ ය. එකම පවුලේ සහෝදර සහෝදරියන් අතර පවා ඇති වෙනස්කම් ගැන අපි දනිමු. එවැනි තත්තවයක දී පොදු මිනිස් මනසක් සාහිත්‍යයෙන් නිරූපණයකිරීමට උත්සාහ කිරීම මනස මොළයට ඌනනයකිරීමට දරණ උත්සාහය සමග බැඳී ඇත. බටහිරයන් මනස මොළයට ඌනනයකිරීමට තැත්කළ ආකාරය වන්න ජයසුමන දිසානායක මහතා විදුසර ට ලියූ ලිපි පෙළෙන් පෙන්වා දී ඇත.

සිංහල සාහිත්‍යයෙහි ඊනියා යථාර්ථයක් නිරූපණය නොවිය යුතු ය. නැති යථාර්ථයක් නිරූපණය කරන්නේ කුමක් සඳහා ද? මාර්ටින් වික්‍රමසිංහ මහතා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි අනුකාරකයකු වූ බැවින් තම කෘතිවලින් ඊනියා යථාර්ථයක් නිරූපණයකිරීමට උත්සාහකළා පමණක් නොව පැරණි සිංහල සාහිත්‍යය ද බටහිර "යථාර්ථවාදී" විචාර කලාවේ මිනුම් දඬු මත පිහිටා විචාරයට ලක්කෙළේ ය. ගුත්තිලය හා ථෙර හා ථෙරි ගාථා ඒ මහතා උසස් ලෙස සැලකුයේ ඒ යථාර්ථවාදී කෘති යැයි තීරණය කිරමෙනි. එහෙත් ගුත්තිලයෙහි සඳහන් සුරගනන්ගේ රැඟුම් හෝ

© Prof. Nalin De Silva

ගුත්තිල පඬිතුමාට සහායවීමට සක් දෙව්දුන් පැමිණීම හෝ තත් නැති වීණාව වාදනයකිරීම හෝ "යථාර්ථවාදී" වන්නේ කෙසේ දැයි මාර්ටින් වික්‍රමසිංහ මහතා පැහැදිලි නො කෙළේ ය.

ක්‍රිස්තියානි නූතනත්වයෙහි බටහිරයන්ගේ බොරු යථාර්ථවාදී සාහිත්‍යය මෙන් ම වෛදික බමුණන්ගේ ආලංකාරිකවාදය ද ප්‍රතික්ෂෙපකිරීමට අපට හැකිවිය යුතු ය. ගුත්තිලයෙහි මූසිල සමග කරන සංගීතවාදයෙහි දී ගුත්තිල පඬිතුමාගේ වාදනය අපට සාමාන්‍යයෙන් කණින් ඇසීමට නොහැකි වාදනයක් බවත්, සිතින් මවාගැනීමට පවා නොහැකි වින්දනයක් ඉන් ලැබුණු බවත් බමුණන්ගේ ආලංකාරිකවාදයට යට නොවී කියන්නේ කෙසේ ද? තත් නැති වීණාව හා සුරඟනන්ගේ රැඟුම් අවශ්‍යවන්නේ එහි දී ය. යථාර්ථවාදය පැත්තකින් තැබීමට නොහැකි බටහිරයන් එවැනි දෑට අධියථාර්ථවාදය යැයි කියනු ඇත. එහෙත් එහි ඇත්තේ සෘජුව පංචේන්ද්‍රියන්ට වහල් නොවී මනසින් යම් යම් දෑ නිර්මාණයකිරීමට (මවාගැනීමට) කෙරෙන උපකාරයකි.

මාර්ටින් වික්‍රමසිංහ මහතා බටහිර ක්‍රිස්තියානි නූතනත්වය එලෙස ම පිළිගත්තේ ය. ඉන්පසු ඔහු කෙළේ අපේ පැරණි සාහිත්‍යය ද බටහිර විචාරකලාවට හසුකිරීම ය. පැරණි සිංහල සාහිත්‍යය බටහිර විචාරකලාවට අනුව උසස් යැයි පෙන්වීම අදීන විචාරකලාවක් ගොඩනැගීමක් නො වෙයි. අද බුදු දහම බටහිර විද්‍යාවට අනුව අර්ථකථනය කරන්නෝ මාර්ටින් වික්‍රමසිංහ මහතා පසුපස යන්නෝ වෙති. බටහිර විද්‍යාවෙන් බුදු දහම පැහැදිලිකරන්නන් අතින් ගොඩනැගුණු බටහිර හෝ සිංහල හෝ විද්‍යාවක් ද නැත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva